වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

පුරප්පාඩු

පොල් පර්යේෂණ ආයතනය

පොල් පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අතිරේක අධ්‍යක්ෂ තනතුර (HM 2-1)

සුදුසුකම් සහ පළපුරුද්ද

බාහිර :

වෘත්තීය සුදුසුකම් :

දෙවන පෙළ ඉහළ හෝ ඊට වැඩි සාමාර්ථයක් සහිත සිව් අවුරුදු විද්‍යා හෝ කෘෂිකර්ම උපාධිය සහ අදාළ ආචාර්ය උපාධිය (Ph.D.)

පළපුරුද්ද :

පිළිගත් ආයතනයක අවම වශයෙන් වසර 18 ක පර්යේෂණ / කළමනාකරණ මට්ටමේ පර්යේෂණ පළපුරුද්ද හා එයින් වසර 10 ක ආචාර්ය උපාධිය (Ph.D.) ලබා ගැනීමෙන් පසුව විය යුතු අතර, අවම වශයෙන් වසර 3 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමක විය යුතුය. සහ

විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ කණ්ඩායම් නායකත්වය සහ මෙහෙයුම් හැකියාව පෙන්නුම් කළ යුතුය.

සටහන : මානව සහ සෙසු සම්පත් පිළිබඳ මනාව පැතිරුණු හා කාර්යක්ෂම කළමනාකරණ පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

අභ්‍යන්තර :

වෘත්තීය සුදුසුකම් :

අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (Ph.D.)

පළපුරුද්ද :

පොල් පර්යේෂණ ආයතනයේ අංශ ප්‍රධානී / ප්‍රධාන පර්යේෂණ නිලධාරී / ප්‍රධාන තාක්ෂණ භූවමාරු නිලධාරී ලෙස අවම වශයෙන් වසර 6 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම සහ

විවිධ ක්ෂේත්‍රවල පර්යේෂණ කණ්ඩායම් නායකත්වය සහ මෙහෙයුම් හැකියාව පෙන්නුම් කළ යුතුය.

සටහන : මානව සහ සෙසු සම්පත් පිළිබඳ මනාව පැතිරුණු හා කාර්යක්ෂම කළමනාකරණ පළපුරුද්ද අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

- **වයස :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට වයස අවුරුදු 40 ට නොඅඩු විය යුතු අතර, 50 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය :** HM 2-1
- **වැටුප් පරිමාණය :** රු. 91,645/- 12x2,700/- - 124,045/-

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2019.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමිවේ.

	2019	2020
වැටුප රු.	82,122	91,645

අනෙකුත් ප්‍රතිලාභ :

1. මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.
   - i. ජීවන වියදම් දීමනාව - රු. 7800/-
   - ii. ප්‍රවාහන දීමනාව 50,000 හෝ වෙන් කරන ලද නිල වාහනයක්
   - iii. ඉන්ධන දීමනාව
   - iv. සන්නිවේදන දීමනාව
   - v. වෘත්තීය දීමනාව
   - vi. තේ දීමනාව රු. 50/-
   - vii. ගාස්තු රහිත අංගසම්පූර්ණ නිල නිවාස පහසුකම් (කම්කරුවෙකු සහිත)

02. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (AR 2)

(කෘෂි ආර්ථික විද්‍යා අංශය)

බාහිර :

(අ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් සිව් අවුරුදු (04) විශේෂ පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිත විද්‍යා හෝ කෘෂිකර්මය උපාධිය හෝ

(ආ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් සිව් අවුරුදු (04) විශේෂ දෙවන පෙළ පහළ සාමාර්ථයක් සහිත විද්‍යා හෝ කෘෂිකර්මය උපාධිය සමග අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ එක් අවුරුදු පශ්චාත් උපාධිය හෝ

(ඇ) පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් විද්‍යා හෝ කෘෂිකර්මය උපාධිය සහ අදාළ ක්ෂේත්‍රයේ ද්වි අවුරුදු පර්යේෂණ පශ්චාත් උපාධිය සහ

අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (Ph.D.) සමග ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 08 ක පර්යේෂණ පළපුරුද්ද.

සටහන : කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳව ආචාර්ය උපාධිය සම්පූර්ණ කළ (Ph.D.)අයදුම්කරුවන් පමණක් සලකා බලනු ලැබේ.

අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණ නිබන්ධන සකස් කර තිබීම අතිරේක සුදුසුකමක් සේ සලකනු ලැබේ.

අභ්‍යන්තර :

ආචාර්ය උපාධිය (Ph.D.) සමග අවම වශයෙන් AR 1 ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරියෙකු වශයෙන් වසර 08 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම. හෝ

ද්වි අවුරුදු පර්යේෂණ පශ්චාත් උපාධිය (M Phil/M.Sc.) සමග AR 1 ශ්‍රේණියේ පර්යේෂණ නිලධාරියෙකු වශයෙන් වසර 10 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

සටහන : කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳව ආචාර්ය උපාධිය සම්පූර්ණ කළ (Ph.D.) අයදුම්කරුවන් පමණක් සලකා බලනු ලැබේ.

අදාළ ක්ෂේත්‍රයේ පර්යේෂණ නිබන්ධන සකස් කර තිබීම අතිරේක සුදුසුකමක් සේ සලකනු ලැබේ.

- **වයස :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය :** AR 2
- **වැටුප් පරිමාණය :** රු. 76,200/- 10x2,000/- - 96,200/-

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2019.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමිවේ.

	2019	2020
වැටුප රු.	67,870	76,200

අනෙකුත් ප්‍රතිලාභ :

1. මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.
   - i. ජීවන වියදම් දීමනාව - රු. 7800/-
   - ii. වෘත්තීය දීමනාව
   - iii. සන්නිවේදන දීමනාව
   - iv. තේ දීමනාව රු. 50/-

03. වතු අධිකාරී තනතුර (JM 1-2)

සුදුසුකම් සහ පළපුරුද්ද :

බාහිර :

පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් කෘෂිකර්මය/ වැවිලි කළමනාකරණය පිළිබඳ වූ උපාධිය සමග හෙක්ටයාර 50 කට වැඩි වතු පාලනය පිළිබඳ අවුරුද්දක (01) පශ්චාත් පළපුරුද්දක් තිබීම.

සටහන : පොල් වතු පාලනය හා කම්කරු පාලනය පිළිබඳ පළපුරුද්ද ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

අභ්‍යන්තර :

පිළිගත් උපාධියක් සහ සහකාර වතු අධිකාරීවරයෙකු ලෙස අවුරුදු 05 සතුටුදායක සේවයක් සපුරා තිබීම හෝ

කළමනාකරණ සහකාර - තාක්ෂණික කාණ්ඩයේ පළමුවන ශ්‍රේණියේ ක්ෂේත්‍ර නිලධාරියෙකු ලෙස වසර 05 ක සතුටුදායක සේවයක් සපුරා තිබීම.

- **වයස :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය :** JM 1-2
- **වැටුප් පරිමාණය :** රු. 43,355/- 10x755/- - 18x1,135/- - 71,335/-

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2019.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමිවේ.

	2019	2020
වැටුප රු.	38,862	43,355

අනෙකුත් ප්‍රතිලාභ :

1. මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.
   - i. ජීවන වියදම් දීමනාව - රු. 7800/-
   - ii. තේ දීමනාව රු. 50/-
   - iii. දුරකථන දීමනාව
   - iv. ගාස්තු රහිතව අංගසම්පූර්ණ නිල නිවාස පහසුකම් (කම්කරුවකු සහිත)

04. තාක්ෂණික නිලධාරී (විදුලි) තනතුර (MA 2-2)

සුදුසුකම් :

බාහිර :

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුලුව සම්මාන සාමාර්ථ හතරක් සමග අවම වශයෙන් එකවර විෂයයන් 6 කින් සමත්වීම සහ අ.පොස. (උසස් පෙළ) විද්‍යා අංශයෙන් අදාළ විෂයය සංයුතිය සමග එකවර විෂයන් තුනකින් සමත් වී තිබීම සහ

අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 05 මට්ටමට අඩු නොවූ සුදුසුකම් ලබා තිබීම.

- **වයස :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය :** MA 2-2
- **වැටුප් පරිමාණය :** රු. 30,310/- 10x300/- - 7x350/- - 4x600/- 20x710/- 52,360/-

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2019.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමිවේ.

	2019	2020
වැටුප රු.	27,170	30,310
ගැළපුම් දීමනාව රු.	382	-

අනෙකුත් ප්‍රතිලාභ :

1. මූලික වැටුප සහ ගැළපුම් දීමනාවට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.
   - i. ජීවන වියදම් දීමනාව - රු. 7800/-
   - ii. තේ දීමනාව රු. 50/-

05. කළමනාකරණ සහකාර (පොත් තබන්නා) තනතුර (MA 2-2)

සුදුසුකම් :

බාහිර :

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සමග අවම වශයෙන් එකවර විෂයයන් 6 කින් සමත් වී තිබීම. සහ

අ.පො.ස. (උසස් පෙළ) අදාළ විෂය සංයුතිය සමග එකවර විෂයයන් තුනකින් සමත් වීම සහ ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ අවසාන විභාගය සමත් වීම හෝ පිළිගත් ආයතනයකින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 5 මට්ටමට අඩු නොවූ සුදුසුකම් ලබා තිබීම.

පරිගණක පිළිබඳ දැනුම (උදා : Word Processing, Spreadsheet, Presentation)

සටහන : ගිණුම්කරණය පිළිබඳ දැනුම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

- **වයස :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය :** MA 2-2
- **වැටුප් පරිමාණය :** රු. 30,310/- 10x300/- - 7x350/- - 4x600/- 20x710/- 52,360/-

© THE ASSOCIATED NEWSPAPERS OF CEYLON LTD.ALL RIGHTS RESERVED.

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2019.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමිවේ.

	2019	2020
වැටුප රු.	27,170	30,310
ගැළපුම් දීමනාව රු.	382	-

අනෙකුත් ප්‍රතිලාභ :

1. මූලික වැටුප සහ ගැළපුම් දීමනාවට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.
   - i. ජීවන වියදම් දීමනාව - රු. 7800/-
   - ii. තේ දීමනාව රු. 50/-

06. කළමනාකරණ සහකාර (ගිණුම්) තනතුර (MA 1-2)

සුදුසුකම් :

බාහිර :

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සමග අවම වශයෙන් එකවර විෂයයන් 6 කින් සමත් වී තිබීම. සහ

අ.පො.ස. (උසස් පෙළ) ගණකාධිකරණ විෂයට සම්මාන සාමාර්ථය සහිතව එකවර විෂයයන් තුනකින් සමත් වීම. සහ

පරිගණක පිළිබඳ දැනුම (උදා : Word Processing, Spreadsheet, Presentation)

සටහන : ගිණුම්කරණය පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් වනු ඇත.

අභ්‍යන්තර :

පහත දැක්වෙන සුදුසුකම් ඇති ප්‍රාථමික මට්ටමේ පුහුණු, ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු, ප්‍රාථමික මට්ටමේ නුපුහුණු සේවකයින් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

භාෂාව (සිංහල / දෙමළ) ඉංග්‍රීසි හා ගණිතය අතුළුව විෂයයන් 04 කට සම්මාන සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය එකවර විෂයයන් 06 කින් සමත් වී තිබීම. සහ

ඉහත සඳහන් සේවා කාණ්ඩයේ ස්ථිර සේවයේ අවම වශයෙන් වසර 05 ක සේවය.

සටහන : MS Word සහ MS Excel පැකේජ මගින් වැඩ කිරීමේ හැකියාව අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

- **වයස :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය :** MA 1-2
- **වැටුප් පරිමාණය :** රු. 27,910/- 10x300/- - 7x350/- - 12x600/- 12x710/- 49,080/-

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2019.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමිවේ.

	2019	2020
වැටුප රු.	25,018	27,910
ගැළපුම් දීමනාව රු.	1,200	-

අනෙකුත් ප්‍රතිලාභ :

1. මූලික වැටුප සහ ගැළපුම් දීමනාවට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.
   - i. ජීවන වියදම් දීමනාව - රු. 7800/-
   - ii. තේ දීමනාව රු. 50/-

07. කළමනාකරණ සහකාර (විගණන) තනතුර (MA 1-2)

සුදුසුකම් :

බාහිර :

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ, ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සමග අවම වශයෙන් එකවර විෂයයන් 6 කින් සමත් වී තිබීම. සහ

අ.පො.ස. (උසස් පෙළ) වාණිජ විෂය ධාරාවෙන් ගණකාධිකරණ විෂයට සම්මාන සාමාර්ථය සහිතව එකවර විෂයයන් තුනකින් සමත් වීම. සහ

පරිගණක පිළිබඳ දැනුම (උදා : Word Processing, Spreadsheet, Presentation)

සටහන : විගණනය පිළිබඳ දැනුම විශේෂ සුදුසුකමක් වනු ඇත.

අභ්‍යන්තර :

පහත දැක්වෙන සුදුසුකම් ඇති ප්‍රාථමික මට්ටමේ පුහුණු, ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු, ප්‍රාථමික මට්ටමේ නුපුහුණු සේවකයින් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

භාෂාව (සිංහල / දෙමළ), ඉංග්‍රීසි හා ගණිතය අතුළුව විෂයයන් 04 කට සම්මාන සහිතව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය එකවර විෂයයන් 06 කින් සමත් වී තිබීම. සහ

ඉහත සඳහන් සේවා කාණ්ඩයේ ස්ථිර සේවයේ අවම වශයෙන් වසර 05 ක සේවය.

සටහන : MS Word සහ MS Excel පැකේජ මගින් වැඩ කිරීමේ හැකියාව අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ.

- **වයස :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය :** MA 1-2
- **වැටුප් පරිමාණය :** රු. 27,910/- 10x300/- - 7x350/- - 12x600/- 12x710/- 49,080/-

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2019.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමිවේ.

	2019	2020
වැටුප රු.	25,018	27,910
ගැළපුම් දීමනාව රු.	1,200	-

අනෙකුත් ප්‍රතිලාභ :

1. මූලික වැටුප සහ ගැළපුම් දීමනාවට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.
   - i. ජීවන වියදම් දීමනාව - රු. 7800/-
   - ii. තේ දීමනාව රු. 50/-

08. ක්ෂේත්‍ර පරීක්ෂක තනතුර

සුදුසුකම් :

බාහිර :

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව (සිංහල / දෙමළ), ඉංග්‍රීසි හා විද්‍යාව/කෘෂිකර්මය ඇතුළුව සම්මාන සාමාර්ථ හතරක් සමග අවම වශයෙන් එකවර විෂයයන් 6 කින් සමත් වී තිබීම.

සහ

අ.පො.ස. (උසස් පෙළ) විද්‍යා අංශයෙන් අදාළ විෂය සංයුතිය සමග එකවර විෂයන් තුනකින් සමත් වී තිබීම.

සටහන : රාජ්‍ය දෙපාර්තමේන්තුවක, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක පොල් ඉඩම්වල කම්කරු පාලනය / පොල් වගා නඩත්තු කටයුතු පිළිබඳ පළපුරුද්ද ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

අභ්‍යන්තර :

පහත දැක්වෙන සුදුසුකම් ඇති ප්‍රාථමික මට්ටමේ පුහුණු, ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු, ප්‍රාථමික මට්ටමේ නුපුහුණු සේවකයින් මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් භාෂාව (සිංහල / දෙමළ), ඉංග්‍රීසි හා විද්‍යාව / කෘෂිකර්මය අතුළුව සම්මාන සාමාර්ථ හතරක් සමග අවම වශයෙන් එකවර විෂයන් 6 කින් සමත් වී තිබීම

සහ

ඉහත සඳහන් සේවා කාණ්ඩයේ ස්ථිර සේවයේ අවම වශයෙන් වසර 05 ක සේවයක් සපුරා තිබීම

- **වයස :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය :** MA 1-2
- **වැටුප් පරිමාණය :** රු. 27,910/- 10x300/- - 7x350/- - 12x600/- 12x710/- 49,080/-

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2019.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමිවේ.

	2019	2020
වැටුප රු.	25,018	27,910
ගැළපුම් දීමනාව රු.	1,200	-

අනෙකුත් ප්‍රතිලාභ :

1. මූලික වැටුප සහ ගැළපුම් දීමනාවට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.
   - i. ජීවන වියදම් දීමනාව - රු. 7800/-
   - ii. තේ දීමනාව රු. 50/-

09. විදුලි කාර්මික තනතුර

සුදුසුකම් සහ පළපුරුද්ද :

බාහිර :

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ හා ගණිතය යන විෂයයන් සමත් වී තිබීම

හා

පිළිගත් ආයතනයකින් ලබාගත් ජාතික වෘත්තීය සුදුසුකම් 04 (NVQ 04) මට්ටමට නොඅඩු අදාළ ක්ෂේත්‍රයේ සහතික පත්‍රයක් (අවුරුද්දකට නොඅඩු) ලබා තබීම. සහ

අදාළ රජයේ ආයතනයක් විසින් පවත්වනු ලබන ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිට හැකියාව සනාථ කළ යුතුය.

- **වයස :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

- **වැටුප් කාණ්ඩය :** PL 3
- **වැටුප් පරිමාණය :** රු. 26,290/- 10x270/- - 10x300/- - 10x330/- 12x350/- 39,490/-

2/2016 චක්‍රලේඛය ප්‍රකාරව 2019.01.01 දින සිට පහත වගුව පරිදි වැටුප හිමිවේ.

	2019	2020
වැටුප රු.	23,566	26,290
ගැළපුම් දීමනාව රු.	1,755	-

අනෙකුත් ප්‍රතිලාභ :

1. මූලික වැටුප සහ ගැළපුම් දීමනාවට අමතරව පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.
   - i. ජීවන වියදම් දීමනාව - රු. 7800/-
   - ii. තේ දීමනාව රු. 50/-

පොදු කොන්දේසි :

01. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
02. අයදුම්කරු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් පසුවිය යුතුයි.
03. අයදුම්කරු දිවයින තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමති විය යුතුයි.

පොදු ප්‍රතිලාභ :

01. 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත යටතේ හා 2016.04.25 දිනැති අංක 2/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව පාරිතෝෂික ගෙවනු ලැබේ.
02. දායකත්ව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට හිමිකම් ඇත.
03. අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල (අපේක්ෂකයන් විසින් වැටුපෙන් 10% ක් හා මණ්ඩලය විසින් 15% ක් අර්ථසාධක අරමුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා ද දායක වනු ඇත)
04. පොල් පර්යේෂණ ආයතනයේ සේවකයින් හට ලැබෙන අනෙකුත් ප්‍රතිලාභද හිමිවනු ඇත.

අයදුම්කරුවන් විසින් උප්පැන්න සහ අනෙකුත් අදාළ සහතිකපත්වල පිටපත් සහ චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරීන්ගෙන් විය යුතුය), ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමග **අත්සන් කරන ලද** තම අයදුම්පත 2019.08.27 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ **සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය, ලුණුවිල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අය තම අයදුම්පත් ඔවුන්ගේ අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පතේ පිටපතක් සෘජුවම එවිය හැකිය.

ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අදාළ සහතිකවල පිටපත් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කාරුණිකව සලකන්න.

මේ පිළිබඳව බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.

මෙම දැන්වීම පොල් පර්යේෂණ ආයතනයේ වෙබ් පිටුව වන www.cri.gov.lk මගින්ද බලාගත හැක.

සභාපති,
පොල් පර්යේෂණ මණ්ඩලය,
ලුණුවිල.

Source: Dinamina, Daily News (2019.08.03)